සන්නස

**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
sjturaus@optusnet.com.au

**Account Name** - **Sannasa Media**
Bank - Cmmonwealth
SBS - 063619
Ac - 10852409

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්4ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

**වැදගත්**

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දක්වීමට අවසර ඇත



# ජනවාරි 8 ජයග්‍රහණයේ ඉරණම



**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

**ඇස ඇස රැඳුණු කඳුළැලි පිසලනු බැරිනම්**
**කුස කුස නැගුණු කුසගිනි දුරලනු බැරිනම්**
**දෙස බස රැසට එන දුක් වළකනු බැරිනම්**
**උසුලනු කුමට නිල බල හා අධිපතිකම්**

මේ කවි ගායනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගෙනි. කවි මෙන්ම විරිදු ගායනයෙහිද දක්ෂයෙකු වන හෙතෙම මේ කවිය ගායනා කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ 66 වැනි සමරුව නිමිත්තෙන් කැම්බල් පිටියේ පැවැති රැස්වීමේදීය. ඉකුත් 03 වෙනිදා සවස පැවැති එම උත්සව සභාව පැවැත්වුණේ ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙනි. ඒ, ඔහු ජනාධිපතිවරයා වීම හේතුවෙන් නොව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා හෙවත් නායකයා වන බැවිනි. ඔහු සිය කතාව අතර තුර කළ පුරවැසි ප්‍රජාවේ අවධානයට යොමුවිය යුතු තවත් ප්‍රකාශ කිහිපයක් මෙසේය.

*"ලංකා මාතාවගේ සාඩම්බර දූ පුතුන් වන අප අද එළැඹ සිටින්නේ සදාදරණීය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ 66 වැනි සංවත්සරයට වුව ද නිසැකයෙන්ම එය අපගේ මාතෘ භූමියට සුවිශිෂ්ට සම්ප්‍රදායන් එක් කළ ඓතිහාසික විජයග්‍රහණයක ආශ්වාදනීය ආවර්ජනයකි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය 1951 සැප්තැම්බර් 02 වැනිදා උපත ලබා හෝරා විසිහතරක් ඉක්ම යන්නට පෙර එනම් සැප්තැම්බර් 03 වැනිදා ගොවි පවුලක ගොවි දරුවකු ලෙස උපත ලද මට මේ පක්ෂය සමග දෛවෝපගත සබඳතාවක් තිබීම මගේ පරම භාග්‍යයක් යෑයි මම අනන්ත වාරයක් කල්පනා කර ඇත්තෙමි. ......*

*2015 ජනවාරි 08 වැනිදා විපක්ෂයේ පොදු අපේක්ෂකයා ලෙස මා විසින් අපගේ මාතෘභූමියට අත්පත් කර දෙන ලද විජයග්‍රහණය ඓතිහාසික ඇරඹුමක් ලෙස දැනටමත් අර්ථගන්වා තිබීම මගේ අප්‍රමාණ සතුටට හේතු වී තිබේ. නොබෝ දිනකින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතීත්වය ද මා වෙත පවරමින් ඒ ඓතිහාසික විජයග්‍රහණයට ආශිර්වාද කිරීමට තරම් කෘතවේදී ගුණයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට තිබීම ගැන මම වඩාත් සතුටු වෙමි. ......*

*ලෝක ඉතිහාසයේ කිසිදු රාජ්‍ය නායකයකු තමන් සතු බලය අතහැරීමට ක්‍රියාකර නැත. ...... විධායක ජනාධිපති ක්‍රමය කෙසේ සංශෝධනය විය යුතු ද, නොඑසේ නම් එය අත්හළ යුතු ද යන්න පිළිබඳ අප පක්ෂය තීරණය කළ යුතුය. මම ඒ වගකීම පක්ෂයට පවරමි. ...... රට වෙනුවෙන් මා ලද මේ සියලු ජයග්‍රහණයන් සඳහා දොර හැර දුන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බව මම නිහතමානීව කියමි. ...... "*
(උපුටා ගැනීම් අවසන්)

8 වන පිටට




